එතුමාණෝ: "කේළම යනු කුමක්දැයි ඔබ දන්නෙහු ද?’ යැයි විමසා සිටියහ. ‘මැනවින් දන්නා අල්ලාහ් හා ඔහුගේ දූතයා’ බව ඔවුහු පවසා සිටියෝය. එතුමාණෝ: ‘ඔබේ සහෝදරයා ගැන ඔහු පිළිකුල් කරන යමක් ඔබ මෙනෙහි කිරීමයි.’

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. එතුමාණෝ: "කේළම යනු කුමක්දැයි ඔබ දන්නෙහු ද?’ යැයි විමසා සිටියහ. ‘මැනවින් දන්නා අල්ලාහ් හා ඔහුගේ දූතයා’ බව ඔවුහු පවසා සිටියෝය. එතුමාණෝ: ‘ඔබේ සහෝදරයා ගැන ඔහු පිළිකුල් කරන
යමක් ඔබ මෙනෙහි කිරීමයි.’ යනුවෙන් පැවසූහ. ‘මා පවසන දෑ මාගේ සහෝදරයා තුළ වී නම්
ඔබේ අදහස කුමක්දැ?’යි එතුමාණන්ගෙන් විමසන ලදී. එතුමාණෝ: ඔබ පවසන දෑ ඔහු තුළ තිබෙන්නේ නම්, සැබැවින්ම ඔබ ඔහු ගැන කෙළම් කියා ඇත්තෙහිය. එය නොවී නම් සැබැවින්ම
ඔබ ඔහු ගැන අවලාදයක් නගා ඇත්තෙහිය.” [صحيح] [رواه مسلم]

තහනම් කරන ලද කේළමෙහි යථාර්ථය ගැන නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ පැහැදිලි කර සිටියි. මුස්ලිම්වරයකු නැති තැන ඔහු පිළිකුල් කරන ඔහුගේ සදාචාර ගුණාංග හෝ ශරීරයේ ගුණාංග අතරින් යමක් මෙනෙහි කිරීමය. උදාහරණ වශයෙන්: පොට්ටයා. වංචාකාරයා, බොරුකාරයා හා එවැනි නින්දා සහගත ගුණාංග ගැන කතා කරන්නාක් මෙනි. එම ගුණාංග ඔහු තුළ දක්නට ලැබුණ ද එලෙසමය. එම ගුණාංග ඔහු තුළ දක්නට නොලැබුණේ නම්, එය කේළමට වඩා දරුණුය. එය ප්රබන්ධයකි. එනම්: මිනිසා තුළ නැති දෙයක් ගොතා පැවසීමකි.

http://sunnah.global/hadeeth/si/show/5326